සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
நலன்புரி நன்மைகள் சபை
WELFARE BENEFITS BOARD
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
Ministry of Finance, Economic Stabilaization & National Policies
මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | MF/WBB/02/Notice/D/Div/2022 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2023.07.14 |

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත

**<u>සුබසාධක ප්‍රතිලාභීන් සඳහා බැංකු ගිණුම් විවෘත කිරීම</u>**

"අස්වැසුම" සුබසාධක ප්‍රතිලාභී මූලික තේරීම් ලැයිස්තුවේ බැංකු ගිණුම් විවෘත කිරීමට අවශ්‍ය බවට සඳහන් පුද්ගලයින් අතුරින් විරෝධතා ඉදිරිපත්ව ඇති පුද්ගලයින් හැර අනෙකුත් අය සඳහා බැංකු ගිණුම් විවෘත කිරීමට ඔවුන්ගේ කැමැත්ත අනුව ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත පරිගනක පද්ධතිය තුලින් ජනිත කරනු ලිපි දැන් නිකුත් කිරීමට හැකියාව ඇත. ජාතික හැඳුනුම්පතක් නොමැති පුද්ගලයින් සඳහා මහජන බැංකුව හැර අනෙකුත් රාජ්‍ය බැංකු තුනෙහි ගිණුම් විවෘත කළ හැක. ඒ අනුව ජාතික හැඳුනුම්පත් ඇති සහ නොමැති පුද්ගලයින් සඳහා අදාළ ලිපිය නිකුත් කිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් පියවර ගතයුතු වේ. මෙම ලිපිය නොමැතිව දැනට පුද්ගලයින් විසින් ගිණුම් විවෘත කර ඇත්නම් ඒවා භාරගත නොහැකි බැවින් ඔවුන්ටද නැවත ලිපි නිකුත් කර ගිණුම් විවෘත කළයුතු බවද සළකන්න.

තවද විරෝධතාවයක් ඇත්නම් එම පුද්ගලයාට මෙම ලිපි ජනිත කළ නොහැකි ලෙස පරිගනක පද්ධතිය දැන් සකස් කර ඇති බැවින් විරෝධතා සියල්ල පද්ධතියට ඇතුළත් කිරීමෙන් පසුව ලිපි නිකුත් කිරීම වඩාත් පහසු වේ. මෙම ලිපි ජනිත කර ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගිණුම වෙත පිවිස Utilities → Bank Account letter බාගත කර ගත හැකිය. පරිගණක පද්ධතිය තුලින් මෙම ලිපි ජනිත කරගන්නා ආකාරය පිලිබඳව මාර්ගගත පුහුණුවක් ද අවශ්‍ය අයට ලබා දීමට කටයුතු යොදා ඇත.

පරිගණක පද්ධතියෙන් ජනිත කර ගැනීමකින් තොරව මෙවැනි ලිපි සමහර ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් නිකුත් කිරීම නිසා බැංකු ශාඛා අපහසුවට පත්වූ අවස්ථාවන් වාර්තා වී ඇත. එබැවින් එවැනි පුද්ගලයින්ට නැවත පරිගණක පද්ධතියෙන් ලබාගත් ලිපියක් නිකුත් කළයුතු බවද කාරුණිකව සලකන්න. ජාතික හැඳුන්ම්පතක් නොමැති පුද්ගලයින් සඳහා නිකුත් කරනු ලබන ලිපියෙහි ඡායාරූපයක් අලවා ප්‍රාදේශීය ලේකම් සහතික කළ යුතු වේ. ප්‍රාදේශීය ලේකම් නොමැති අවස්ථා වලදී බලය දෙනු ලැබූ වෙනත් මාණ්ඩලික නිළධාරියකු විසින් ප්‍රාදේශීය ලේකම් වෙනුවට අත්සන් කිරීම ගැටළුවක් නොවේ. සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සභාපතිගේ මුද්‍රා අත්සන මෙම ලිපිවලට යොදා ඇති බව ද සලකන්න.

යම් ප්‍රතිලාභියකු ලෙඩ රෝගවලින් පෙලෙන හෝ ආබාධිත පුද්ගලයකු නම් එවැනි පුද්ගලයින් සඳහා නිවෙස්වලට ගොස් බැංකු ගිනුම් විවෘත කිරීමේ වැඩ පිළිවෙලක් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් ආරම්භ කර ඇති බැවින් ඒ පිළිබඳ පුද්ගලයින් දැනුවත් කිරීම සුදුසු බව ද දන්වා සිටිමි.

බැංකු ගිණුම් විවෘත කිරීම සම්බන්ධයෙන් විවිධ විමසීම් ඉදිරිපත්වන හෙයින් නැවත මෙම උපදෙස් නිකුත් කළ බැව් වැඩිදුරටත් සඳහන් කරමි.

ආර්.පී.ආර්. රාජපක්ෂ
අතිරේක කොමසාරිස්(මෙහෙයුම්)
කොමසාරිස් වෙනුවට

පිටපත්:

1. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත - දැ.ගැ.පි.
2. ලංකා බැංකුව/මහජන බැංකුව/ජාතික ඉතිරි කිරීමේ බැංකුව/ප්‍රාදේශීය සංවර්ධන බැංකුව -දැ.ගැ.පි/අ.ක.ස.

කාර්යාලය / அலுவலகம் / Office — Tel: 009411- 2151481, 009411- 2484600/4117, Fax: 009411- 2151482
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / e-mail — welfarebenefitboard2016@gmail.com, info@iwms.wbb.gov.lk
වෙබ් අඩවිය / இணையதளம் / Website — www.wbb.gov.lk